# බළන්ගොඩ නගර සභාව
## 2020-03-10 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** - **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** - **2020.03.10**

**වේලාව** - **පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |

16. ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා

17. ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2020-02-11 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් 2020-02-11 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාවේ සංශෝධන කිසිවක් නොතිබුණි.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- මහජන නියෝජිතයින් සඳහා මාසිකව රු.15,000.00ක මාසික දීමනාවක්, රු.3,000.00ක දුරකථන දීමනාවක්, රු.5,000.00 ක ඉන්ධන දීමනාවක් ලැබෙන අතර ඇතැම් ගරු මන්ත්‍රීවරු මසකට එක් දිනක් පමණක් සභාවට පැමිණ ගරු සභාපතිතුමා හා නිළධාරීන් සමඟ සම්බන්ධ නොවී කිසිඳු කැපකිරීමක් සිදු නොකර ඔවුන් ඉදිරිපත් කළ යෝජනා ඊළඟ මාසය වන විට ඉටු කර ඇති බවට අපේක්ෂා කිරීම පමණක් සුදුසු නොවන බව පවසන ලදී. එමෙන්ම ගරු මන්ත්‍රීවරුන් තම ව්‍යාපාරික කටයුතු සමඟ මහජන නියෝජිතයන් වශයෙන් මහජනතාව වෙනුවෙන් කළ යුතු සේවාවන් වගකීමෙන් ඉටුකරන්නේ නම් සභාව වෙත පැමිණෙන දෝෂාරෝපණ හා විවේචන අවම වන බවද සභාවේ නිළධාරීන් සමඟ සම්බන්ධ වී අවශ්‍ය කාර්යයන් ඉටු කර ගන්නා ලෙසද එසේ කටයුතු කරන ගරු මන්ත්‍රීවරුන් වෙත ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව ද ගරු සභාපතිතුමන් පවසන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් බාහිර පාර්ශවයන් සමඟ පවත්වන රැස්වීම් සඳහා ගරු සභිකයින් සහභාගි කර ගන්නා ලෙසත් අද දින සිදුකළ මෙම නිවේදනය පිළිබඳ තමන් සතුටු වන බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තම කණ්ඩායමේ සියළු දෙනා හැකි සෑම විටම නිළධාරීන් සමඟ සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කර ගන්නා අතර නිළධාරීන් සභාවේ රැඳී සිටින දිනවල දී සභාව පවත්වන ලෙස පවසන ලදී.

දෙහිගස්තලාව, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි අයි.ජී.ලක්ෂාන් සමීර සිරිවර්ධන සිසුවා 2019 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යා අංශයේ රත්නපුර දිස්ත්‍රික් ප්‍රථම ස්ථානය හා දිවයිනෙන් හයවන ස්ථානය ලබා ගැනීම වෙනුවෙන් සභාපති අරමුදල මගින් රු.5,000.00 ක මුදලක් ලබා දී විශේෂ ඇගයීමක් මෙදින සභාවේදී සිදු කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විශ්ව විද්‍යාල සිසුවෙකු සඳහා රු.5,000.00 ක මුදලක් ලබාදීම ප්‍රමාණවත් නොවන අතර විශ්ව විද්‍යාලය අධ්‍යාපනය සඳහා අවශ්‍ය උපකරණයක් හෝ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනාවෙන් රු.2,500.00 වැනි මුදලක් අයකර එම සිසුන්ට ලබා දීම සුදුසු බව පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සභා අරමුදලින් වාර්ෂිකව තෝරාගත් විශ්ව විද්‍යාල සිසුන් සඳහා එක් දරුවෙකුට රු.10,000.00 ක ශිෂ්‍යත්වාධාර ලබා දෙන අතර අද දින මෙය විශේෂ අවස්ථාවක් සේ සළකා ලබා දෙන බව පවසන ලදී.

අනතුරුව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, සභාපති අරමුදල සඳහා අය කරන මුදල ප්‍රමාණවත් නොවේනම් ගරු මන්ත්‍රීවරුන්ගෙන් මාසික දීමනාවෙන් අයකරන මුදල රු.500.00 සිට රු.750.00 දක්වා වැඩි කරන ලෙස පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- නව බස්නැවතුම්පල සරණ ව්‍යාපාරික සංසදය විසින් නව බස්නැවතුම්පල වෙළෙඳ හිමියන්ගේ යතුරු පැදි නතර කර තැබීම සඳහා නගර සභා කියවීම් ශාලාව අසලින් කොටසක් ලබා දෙන ලෙසත්, බස්නැවතුම්පල සිවිලිමේ ඉතිරි වැඩ සම්පූර්ණ කර විදුලි පහන් සවිකර දෙන ලෙසත්, බස්නැවතුම්පලේ පළමු මහලේ සී.සී.ටීවී කැමරා සවිකර දෙන ලෙසත්, බස්නැවතුම්පලෙහි ස්ථාන ගත කර තිබූ ටීවී නැවත ස්ථාපිත කර දෙන ලෙසත් ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, බස්නැවතුම්පල වෙළෙඳ හිමියන්ගේ නම් ලැයිස්තුවක් ලබාගෙන නගර සභා නිල නිවස ඉදිරිපිට කොටස ලබා දීම සුදුසු බවත්, බස් නැවතුම්පල ඉහළ මාලයේ වැසිකිළි දෙක අලුත්වැඩියා කර බස්නැවතුම්පල වෙළෙන්ඳන් සඳහා රු.5.00 ක මුදලක් අයකර ලබා දීමත් වෙනත් අයගෙන් රු.10.00 ක් අයකර ලබා දීමත් සුදුසු බව පවසන ලදී.

- අංක 258, මහජන පොලෙහි වෙළෙඳාම් කරන ජේ.සුසන්ත ප්‍රියදර්ශන විසින් මහජන පොලෙහි විදුලි පහන් 10 ක් සවිකර තිබුණද තමන් ඇතුළුව 12 දෙනෙකු වෙළෙඳාම් කරන ස්ථානයට විදුලි ආලෝකය නොමැති බැවින් එම ස්ථානයට විදුලි ආලෝකය ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් සකසා දෙන ලෙස ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මහජන පොළෙහි එම ස්ථානයට පමණක් විදුලි ආලෝකය නොලැබෙන බැවින් එම ස්ථානයට විදුලි පහන් සවි කිරීම සුදුසු බව පවසන ලදී.

- පොදු වෙළෙඳසැලෙහි අංක 04 දරණ කඩ කාමරයේ වෙළෙඳම් සිදුකළ ටී.ඩී.එම්.ආර්.චන්ද්‍රරත්න මහතා විසින් පොදුවෙළෙඳසැලෙහි එළවළු වෙළෙඳාම සිදු නොවන බැවින් වෙනත් ස්ථානයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිය ද මෙතෙක් වෙනත් ස්ථානයක් නොලැබුණු බැවින් විකල්ප ස්ථානයක් ලෙස බස්රථ පොළ පිවිසුම් මාර්ගයේ අලුතින් ඉදිකර ඇති ගොඩනැගිල්ලට පිටුපසින් ඇති කොටස හෝ බස්රථ පොලෙහි සී.ටී.බී.බස් රථ පොල ඉදිරියෙන් ඇති ත්‍රී රෝද රථ නැවතුම්පල පිටුපස ඇති කොටස හෝ පිට්ටනිය පිටුපසින් දිවෙන මාර්ගයෙහි ඇති ගල් කඩන ස්ථානය ඉදිරියෙන් ඇති කොටස හෝ (ගඟ අසල) පරීක්ෂා කර බලා ලබා දෙන ලෙස පවසා එවූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා**

අංක 217/7, බස්නැවතුම්පල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්.ජී. ඉන්ද්‍රානි මහත්මිය විසින් බනස/ක/66/59/19 දරණ ගොඩනැගිල්ලෙහි තුන්වන මහළ ඉදිකිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ එම ගොඩනැගිලි අයදුම්පත සභාව විසින් අනුමත කළ නමුත් එය ලබා දෙන තෙක් නොසිට නීත්‍යානුකූල නොවන පරිදි කොටස් කිහිපයක් ඉදි කර ඇති බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, මෙම ගොඩනැගිල්ලෙහි තුන්වන මහළ ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය අවසර ලබා නොදීමට හේතුව වනුයේ ඊට ඉහළින් අධිබලැති විදුලි රැහැන් පද්ධතිය ගමන් කිරීම නිසා වුව ද ඒ අසළ ඇති අනෙක් ගොඩනැගිල්ලෙහි තුන්වන මහළ ඉදි කිරීම සඳහා අවසර ලබා දී ඇති බැවින් මේ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර අවසර ලබා දීමට කටයුතු කල යුතු බව පවසන ලදී.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම පුද්ගලයාගේ ගොඩනැගිලි අයදුම්පත අනුමත කරන තෙක් නොසිට ඔහු විසින් බස්නැවතුම්පල ගුවන් පාලම සම්බන්ධ වන ලෙස ඉදිකල පඩිපෙළ නාගරික සංවර්ධන අධිකාරිය විසින් කඩා ඉවත් කළ බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පවසා සිටියේ ඔහු කර ඇති මෙම වරද හේතුවෙන් මෙය ඉටු කිරීමට අවසර ලබා දිය නොහැකි බව ලිඛිතව දැනුවත් කරන ලෙසයි. මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ අවශ්‍ය දැනුවත් කිරීම් ලිඛිතව සිදු කර ඇති බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා පවසා සිටියේ නාගරික සංවර්ධක අධිකාරිය විසින් මෙම පඩිපෙළ කඩා ඉවත් කළ ද ඒ ආසන්නයේම නගර සභා සතු ඉඩමක තවත් පඩිපෙලක් තිබෙන බවයි. හිටපු ගරු සභාපතිතුමාගේ පාලන සමයේදී මෙම පඩිපෙළ කඩා ඉවත් කිරීම සඳහා උසාවි නියෝගයක් ලබා ගත් නමුත් එය කඩා ඉවත් නොකළ බැවින් මෙම පුද්ගලයින් ද අනවසරයෙන් මෙය ඉදි කර ඇතිනම් ඒ සඳහා දඩයක් අයකර එය අනුමත කර දෙන ලෙස පවසා සිටින ලදී.

අනතුරුව මේ පිළිබඳව කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

අනතුරුව ගරු වැඩ අධිකාරිතුමාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

ප.ව.11.35ට පමණ ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සභාවෙන් පිටව යන ලදී.

- එළඹෙන සිංහල හා හින්දු අලුත් අවුරුදු සමයේ බලන්ගොඩ නගරයට පැමිණෙන ජනතාවට බළන්ගොඩ නගරයේ පවතින විවිධ ආයතන තුළින් සැපයෙන සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම, අලුත් අවුරුදු සමයේ ජනතාවගේ ආරක්ෂාව හා සෞඛ්‍ය ආරක්ෂාව, සිංහල අවුරුද්දේ ඇති වැදගත්කම ආදිය පිළිබඳ ආගමික නායකයින් හා ආයතන සම්බන්ධ කරගෙන "අවුරුදු උදාන 2020" නමින් බළන්ගොඩ නගරය ආවරණය වන පරිදි අලුත් අවුරුදු විශේෂ විකාශයක් 2020-04-07 දින සිට 2020-04-12 දක්වා පෙ.ව.08.30 සිට ප.ව.6.30 දක්වා පැවැත්වීමට අවසර ලබා දෙන ලෙස නාලක ජේ.හෙට්ටිආරච්චි මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  බලපත්‍ර ගාස්තු අයකර ලබා දීම සුදුසු බවත් අධිකරණය අසළ හා ආගමික ස්ථාන අසළ ශබ්ද විකාශන යන්ත්‍ර නොදැමිය යුතු බවත් සභාවේ මතය විය.

- අංක 385/01, ඒ විලියම් මාවත, මිරිස්වත්ත, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්.අයි.එම්.අලාබ්දීන් මහතා විසින් තම ඉඩමට යාබද ඉඩමේ අයිතිකරු වන තුෂාර යන අය විසින් එම ස්ථානයේ අත්තිවාරමක් දමා ගොඩනැගිල්ලක් තනමින් සිටින අතර ඔහු විසින් දැනට දමා ඇති ස්ලැබ් එක තම ඉඩමේ වැට අයිනට පිහිටා ඇති බැවින් වැසි දිනවල ජලය තම ඉඩම තුළට වැටීමෙන්

ඉඩමට හානි සිදු වී ඇති බව පවසා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- අංගම්මුල්ල, අගලවත්ත ලිපිනයෙහි පදිංචි කේ.ජී.ශාම් චමින්ද මහතා විසින් සර්කස් සංදර්ශනයක් පැවැත්වීමට සුදුසු ස්ථානයක් ලබා දෙන ලෙසත්, දිනකට රු.1,000.00 බැගින් අයකරන ලෙසත් පවසා එවූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ටිකට්පතකින් 15%ක් අයකර පිට්ටනිය අසළ ස්ථානය ලබා දිම සුදුසු බව සභාවේ මතය විය.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

මෙදිනට නියමිත මිළ ගණන් විවෘත කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

මිළ ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කර ගන්නා ලදී.

04.01 කර්මාන්ත නඩත්තු සඳහා අවශ්‍ය තාර බැරල් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

- කර්මාන්ත නඩත්තු සඳහා අවශ්‍ය තාර බැරල් මිළදී ගැනීම සඳහා ආයතන පහකින් මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ජී.කේ.යූ.සී ආයතනය වෙතින් තාර බැරලයක් රු.12,222.00 ක මුදලකට ලබා ගැනීමට ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය විය.

04.02 සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටයර් ලබා ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

| ටයර්වල ප්‍රමාණය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|
| 600x16 | 08 |
| 650x15 | 14 |
| 700x15 | 04 |
| 650x16 | 10 |
| 700x16 | 12 |
| 14x17.5 | 02 |
| 13.6x28 | 02 |

- සභාව සතු වාහන සඳහා අවශ්‍ය ඉහත සඳහන් ප්‍රමාණයේ ටයර් ලබා ගැනීම සඳහා ආයතන තුනකින් මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථාව මගින් ලබා ගැනීමට ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය විය.

ඉහත සඳහන් ටෙන්ඩර් මණ්ඩල තීරණ ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 05. කල් දී ඇති ප්‍රශ්න

### *05.01 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා*

05.01.01 දැනට තිබෙන හා නොතිබෙන ගිනි කපොලු ගැන ගන්නා තීරණ

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා දැනට තිබෙන ගිනි කපොලු පිළිබඳ සමීක්ෂණයක් සිදුකරන බව පවසා සිටින ලදී.

05.01.02 ගුවන් පාලම ඔස්සේ බස්නැවතුම්පලේ උඩු මහලට බයිසිකල් යෑම ගැන සභාවක් වශයෙන් ගන්නා තීරණ හා විසඳුම් කවරේද?

මෙහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා මේ සම්බන්ධයෙන් බස්නැවතුම්පල වෙළෙඳ හිමියන් දැනුවත් කර ඇති අතර වාහන නතර නොකරන ලෙස දැන්වීමක්ද පළ කර ඇති බව පවසන ලදී. එමෙන්ම කියවීම් ශාලාව අසළ ස්ථානය මේ සඳහා ලබාදීමට තීරණය කර ඇති බව පවසන ලදී.

05.01.03 බළන්ගොඩ අධිකරණයට යාමට තිබූ එකම මාර්ගය සහරාන් සිද්ධිය දිනවල වසා දැමුවත් තවමත් විවෘත කර නොමැත. මහජනතාවට පීඩාවක් ගෙන දෙන මෙම කාර්යය සොයා බලා මාර්ගය විවෘත කරදීමට සභාවක් හැටියට මැදිහත් විය නොහැකිද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් මේ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වා අධිකරණයට ලිපියක් ඉදිරිපත් කර ඇති බව පවසන ලදී.

05.01.04 නගරයේ අයාලයේ යන බල්ලන්ගේ ප්‍රශ්නයට දැනට අරගෙන ඇති තීන්දු තීරණ මොනවාද? පළාත් සභාවේ පිළිතුර යථාර්තයක් නොවන්නේ මන්ද?

සුනඛයන් සඳහා වාර්ෂිකව සිදු කරන ජලභීතිකා එන්නත මේ වන විට සිදු කර ඇති අතර සුනඛ වන්ද්‍යාකරණය මෙම මස තුළ සිදු කිරීමට නියමිත බව මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසන ලදී.

### *05.02 ගරු නාගරික මන්ත්‍රීනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය*

05.02.01 කසළ එකතු කිරීම සඳහා ලබා ගැනීමට අනුමත වී ඇති බොලේරෝ ට්‍රක් රථය මිළදී ගැනීමේ වර්තමාන තත්ත්වය

මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා මෙම ට්‍රක් රථය මිළදී ගැනීමට අවශ්‍ය සියළු කටයුතු සිදුකර ඇති බව පවසන ලදී.

05.02.02 කාර්පාක් අංක 06 කඩ කාමරය සම්බන්ධයෙන් 2018-05-28 සභාවේ තීරණය වූ පරිදි ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කර ඇත්ද

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි අරුණි ගමගේට ලබාදී ඇති බැවින් නැවත වතාවක් ආණ්ඩුකාරතුමාට ලිපි යොමු නොකරන ලද බව ගරු සභාපතිතුමන් පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය මෙම කඩ කාමරය අරුණි ගමගේ මහත්මියට ලබා දීම නිසා මෙහි පෙර බදු ගැනුම්කරු වූ එබ්.එල්.ආනන්ද මහතාට අසාධාරණයක් සිදුව ඇති බව පවසන ලදී.

ඒ අනුව ඩබ්.එල්.ආනන්ද යන අයට ලබාදීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපි යැවීමට තීරණය විය.

05.02.03 මුගුණමලය මාර්ගයේ මාර්ගයට ඉදිකර ඇති වැටවල්වලට ගත් ක්‍රියාමාර්ග කවරේද?

මෙයට පිළිතුරු ලබාදෙමින් මාර්ගයට ඉදිකර ඇති වැටවල් ඉවත් කර ගන්නා ලෙස දන්වා 2020.03.06 වන දින ලිපි ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

05.02.04 පවුල් සෞඛ්‍ය නිළධාරි කාර්යාලය ඉදි කිරීමට ඉඩම් කොටසක් ඉල්ලීමට අදාළව ගෙන ඇති පියවර පහදන්න.

මේ සඳහා සුදුසු ඉඩමක් කිරිඳිගල වසමෙන් ලබා දෙන ලෙස ඉල්ලා 2020.03.06 දින ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

05.02.05 පොදු වෙළෙඳසැලේ බදු මුදල් සංශෝධනය සම්බන්ධයෙන් අදාළ ආයතනයන් දැනුවත් කර ඇත්ද? ලැබී ඇති පිළිතුරු කවරේද?

ඉරිදා පොළ පරිශ්‍රයේ කඩ කාමරයක් ලබාදීමට සභාව තුළ සාකච්ඡා වූ බැවින් බදු කුලිය සංශෝධනය කිරීම සඳහා ලිපි ඉදිරිපත් නොකළ බවද අදාළ කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මෙවර සභාවට ඉදිරිපත් කර ඇති බවද පවසන ලදී.

05.02.06 විදුලි බල මණ්ඩලය හා ඩයලොග්, ටෙලිකොම් ආයතනවලට අයත් කණු ඉවත් කිරීමට අදාලව ප්‍රගතිය

කණු ඉවත් කරන ලෙස දන්වා විදුලි බල මණ්ඩලය හා ටෙලිකොම් ආයතනය වෙත 2020.03.06 දින ලිපි යවා ඇති බව මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමන් පවසන ලදී.

***05.03 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා***

05.03.01 පසුගිය සභාවාරයේ සාකච්ඡා වූ විශාල දැන්වීම් පුවරු (20X20) ප්‍රමාණයේ ඉදි කිරීම පිළිබඳ ප්‍රගතිය කුමක්ද?

මෙයට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් මේ සම්බන්ධව වැඩපිළිවෙලක් සකස් කරමින් පවතින බවත් 2020 නොවැම්බර් මස අවසානයේ මෙම පුවරු ස්ථාපනය කිරීම සිදු කරන බවත් පවසන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

***06.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

06.01.01 2020 අප්‍රේල් මස පැවැත්වෙන ලේ දන්දීමේ වැඩසටහන සඳහා රු.40,000.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමත කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.02 පළාත් පාලන කොමසාරිස්ගේ ප.පා.කො.චක්‍රලේඛ 02/2020 පරිදි පළාත් පාලන ආයතන නියෝජිතයින් සඳහා මසකට රු.5,000.00 ක උපරිම සීමාවකට යටත්ව ඉන්ධන දීමනාව මාසික දීමනාවක් වශයෙන් ලබා දීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.03 2017 වර්ෂයේ මහජන පොළ ආපන ශාලාව සඳහා ගිවිසුම් ඇප තැම්පතු වශයෙන් රු.11,220.00 ක මුදලක් ජී.අයි.කුමාර යන අය විසින් තබා ඇති අතර එම වසරේ නොවැම්බර් හා දෙසැම්බර් මාස වල කුලී ගෙවා නොමැති බැවින් රාජ්‍ය ආදායමට ගෙන ඇති එම මුදල නැවත ආදායමට ලබා ගෙන හිඟ මුදල් පියවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.04 ආපදා ණය ලබා ගැනීම - එස්.ආර්.සිරිකාන්තන් මයා - රු.250,000.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.05 බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක පිරිස සහ ට්‍රැක්ටර් රථ රියදුරු මහතුන් මාතර මහ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය අධ්‍යයන චාරිකාවක් සඳහා සහභාගි කරවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.06 2020 වර්ෂය සඳහා නිළ ඇඳුම් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කරන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා නිළ ඇඳුම් අඳින නිළධාරීන් සඳහා පමණක් නිළ ඇඳුම් ලබා දීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.07 සෞඛ්‍ය අංශය හා කාර්යාලය සඳහා අවශ්‍ය භාණ්ඩ මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| ෆයිනෝල් කෑන් | 20 |
| හයිලයිට් පෑන් | 10 |
| මොබ් බ්‍රෂ් | 10 |
| ඕ.ඊ. කෑන් | 15 |
| අඩිරූල් | 10 |
| ටිපෙක්ස් | 10 |
| 10X15 ලියුම් කවර | 75 |
| ඉදල් | 100 |
| කොසු | 50 |
| පර්මනන්ට් මාකර් පෑන් | 10 |
| ටයිල් ක්ලීනර් | 10 |
| ෆයිල් | 300 |
| 9X4 ලියුම් කවර | 250 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.08 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2020-02-10 | බස්නැවතුම්පල ඉරිදා පොළ වැසිකිළි පද්ධතිය භාරකරු වැටුප් ගෙවීම 2020-01-01 සිට 2020-01-31 | 18-2 | 5038 | 35,650.00 |
| | කර්මාන්ත-කොන්ත්‍රාත් කම්කරු වැටුප් 2020-01-22 සිට 2020-01-31 | 18-3 | 5038 | 119,600.00 |
| | දෛනික කම්කරු හා රියදුරු යෙදවීම (කසළ ඉවත් කිරීම) | 18-05 | 5038 | 198,825.00 |
| | කාණු ශුද්ධ පවිත්‍ර කිරීම හා සෞඛ්‍ය අංශයේ වැඩ සඳහා වැටුප් ගෙවීම | 18-6 | 5038 | 80,500.00 |
| | පොහොර හැලීම හා කසළ තේරීම 2020-01-01 සිට 2020-01-31(දෛනික වැටුප්) | 18-7 | 5038 | 138,575.00 |
| | පොලිතීන් තේරීම 2020-01-01 සිට 2020-01-31 වැටුප් ගෙවීම | 18-8 | 5038 | 63,250.00 |
| 2020-02-25 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2020 ජනවාරි පොදු වෙළඳසැල හා මහජන පොළ ජල බිල්පත් ගෙවීම | 57 | 5070 | 20,867.61 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2020 ජනවාරි බස්නැවතුම්පල ජල බිල්පත් ගෙවීම. | 58 | 5070 | 64,185.77 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 පෙබරවාරි කාර්යාලය/ නගර සභාවට යාබද ගොඩනැගිල්ල විදුලි බිල් ගෙවීම | 59 | 5071 | 38,028.00 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 පෙබරවාරි පොදු වෙළෙඳසැල / මහජන පොළ/ මුරකුටිය (පොළ)/වැසිකිළිය (පොළ) /දොරවෙළ ගබඩාව/ ආපන ශාලාව (පොළ) / විදුලි බිල්පත් ගෙවීම | 61 | 5071 | 13,546.00 |
| 2020-03-02 | Dialog Broadband Networks (Pvt) Ltd | 03 | 5098 | 21,147.80 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 ජනවාරි බස්නැවතුම්පල විදුලි බිල ගෙවීම | 18 | 5157 | 41,519.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කුසුම්සිරි හෝටලය ඉදිරිපිට කාණු පද්ධතිය ඇතුලු විවෘත කාණු පද්ධති දිනපතා ශුද්ධ පවිත්‍ර කිරිම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.09 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- බස්නැවතුම්පල සිවිලිම ගැසීම සඳහා දිලුමිණ බිල්ඩර්ස් මගින් පලංචි මිළදී ගැනීම වෙනුවෙන් රු.28,000.00 ක මුදලක් ගෙවීම.
- 56-1906 කෘෘ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රු.10,390.00 ක මුදලක් කේ.ඒ. ඔටෝ සර්විස් වෙත ගෙවීම.
- LL -7688 දරණ කෘෘ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රු.10,565.00 ක මුදලක් කේ.ඒ.ඔටෝ සර්විස් වෙත ගෙවීම.
- PF - 4006 දරණ ඩබල් කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රු.12,467.50 ක මුදලක් කේ.ඒ.ඔටෝ සර්විස් වෙත ගෙවීම.
- 2020-02-01 දින සිට 2020-02-29 දින දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.10 2019 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටුව පත්කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2019 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටුව 2020-03-12 දින පෙ.ව.10.00ට පැවැත්වීම සුදුසු බවත් ඒ සඳහා

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එස්.එච්.ඒ.කරුණාරත්න මිය | ලේකම් |
| 02 | එම්.ඩී.එස්.ප්‍රනාන්දු මයා | ගණකාධිකාරී |
| 03 | ජී.ඩී.ඒ.සේමපාල මිය | ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී |
| 04 | ඊ.ආර්. සුමනාවති මිය | ප්‍රජා සංවර්ධන නිළධාරී |
| 05 | එස්.එම්.සී.එස්.කේ.අබේසිරිවර්ධන මයා | තාක්ෂණික නිළධාරී |
| 06 | සිසිර සේනාධීර | තාක්ෂණික නිළධාරී |
| 07 | මල්කාන්ති උඩවත්ත මිය | පුස්තකාලයාධිපති |
| 08 | ටී.ජී.කේශනි ප්‍රසාදිකා මිය | සංවර්ධන නිළධාරී |
| 09 | රජිත කොස්වත්ත මයා | සංවර්ධන නිළධාරී |
| 10 | රසිකා සෙව්වන්දි ගුණසේකර මිය | සංවර්ධන නිළධාරී |
| 11 | ඩබ්.එස්.මෙනේරිවත්ත මිය | කළමනාකරණ සේවා නිළධාරී |
| 12 | ඊ.එම්.චිත්‍රා නිශාන්ති මෙය | කළමනාකරණ සේවා නිළධාරී |
| 13 | ෂැලෝම් ඒන්ජල් වාස් මිය | කළමනාකරණ සේවා නිළධාරී |

පත් කිරීමටත්, මන්ත්‍රී නියෝජනය ලෙස ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පත්කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.11 බස්නැවතුම්පල අසළ පදික වෙළෙඳසැල් සඳහා ආලෝකය ලබා දීම සඳහා 100W Flash Light 04 ක් මිළදී ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.12 නගර සභා පෙර පාසල් අවුරුදු උළෙල සඳහා ත්‍යාග ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.13 වැවවත්ත පෙර පාසල් අවුරුදු උළෙල සඳහා ත්‍යාග ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.14 ලංකා පොස්පේට් ලිමිටඩ් විසින් පොස්පේට් 50Kg මිටියක් සඳහා ලබා දී ඇති මිළ ගණන රු.550.00 කි. එයින් මිටි 100 ක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.15 බළන්ගොඩ සිට අනුරාධපුර ගොස් බලපත්‍රය සකස් කර ඉන්පසු එප්පාවල පොස්පේට් අංගනයට ගොස් නැවත බළන්ගොඩ නගර සභාවේ බැංකියවත්ත කොම්පෝස්ට් අංගනය වෙත පොස්පේට් 50Kg මිටි 100 ක් ප්‍රවාහනය කිරීම සඳහා එස්.බාලක්‍රිෂ්ණන් මහතාගෙන් ලැබී ඇති රු.25,000.00 ක අවම මිළ ගණන සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.16 වීථි පහන් සඳහා අවශ්‍ය 30W CFL බල්බ් 200 ක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව පහත සඳහන් ආයතන දෙකින් එකක් තෝරා ගැනීම.

ඔරේන්ජ් - වසරක වගකීම සහිත එක් බල්බයක මිළ රු.743.00 - ප්‍රමානා එන්ටර්ප්‍රයිසස්

ඔරේන්ජ් - වගකීම් කාලයක් නොමැතිව එක් බල්බයක මිළ රු.743.00 - ඔරියන්ට් ඉලෙක්ට්‍රිල්ස්

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා වසරක වගකීම කාලයක් සහිත බල්බ මිළදී ගැනීම සුදුසු බවට කළ යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.17 කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය යතුරු සෙට් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ලැබී ඇති පහත සඳහන් ආයතන තෝරා ගැනීම.

| | | | |
|---|---|---|---|
| යතුරු සෙට් 8-32 16Pcs (Kaito)- | රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව - | | රු.6,500.00 |
| යතුරු සෙට් 18Pcs (Eastman)- | සරණි පික්චර් පැලස් | - | රු.9,850.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.18 සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය වැහි කබා 25 ක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ලැබී ඇති ජෝති සටෝර්ස් මඟින් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

කලිසම සහිත වැහි කබා එකක මිළ - රු.1,500.00

කලිසම රහිත වැහි කබා එකක මිළ - රු.1,350.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.19 කාර්යාලීය අවශ්‍යතා සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව පහත සඳහන් පරිදි මිළදී ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

**ජෝති ස්ටෝර්ස්**

| වර්ගය | ප්‍රමාණය | මිළ රු. | මුළු මුදල |
|---|---|---|---|
| පංචර් | 05 | 225.00 | 1,125.00 |
| ඩස්පෑන් | 04 | 50.00 | 200.00 |
| ඩස්බින් | 05 | 260.00 | 1,300.00 |
| පොඩි කතුරු | 05 | 50.00 | 2,500.00 |
| ප්ලැටිග්නම් | 01 | 235.00 | 235.00 |
| හුණු කැට පෙට්ටි | 01 | 150.00 | 150.00 |
| A4 බණ්ඩල් | 75 | 675.00 | 50,625.00 |
| ෆයිනෝල් ලී.4 | 10 | 490.00 | 4,900.00 |
| බිලුඩෝ ක්ලිප් | 30 | 17.50 | 525.00 |
| පෑන් | 700 | 7.75 | 5,425.00 |
| ඉන්ක් පෑඩ් | 05 | 160.00 | 800.00 |

**නිව් ජෝති ස්ටෝර්ස්**

| වර්ගය | ප්‍රමාණය | මිළ රු. | මුළු මුදල |
|---|---|---|---|
| කැල්කියුලේටර් | 5 | 1,700.00 | 8,500.00 |
| ස්ටෙප්ලර් මැෂින් | 5 | 250.00 | 1,250.00 |
| වයිපර් | 5 | 200.00 | 1,000.00 |
| අඩිරූල් | 10 | 30.00 | 300.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.20 227-5020 ගලි බවුසරයට මීටර් බෝඩ් එකක් ලබා ගැනීම සඳහා මිළ ගණන් අනුමත කර ගැනීම -රු.17,000.00 - විකසිත එන්ටර්ප්‍රයිසස්

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.21 ND-5124 වෑන් රථයෙහි පහත සඳහන් සේවා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- පූර්ණ සේවා කිරීම.
- ඉදිරිපස ටයර් යුගලයේ බ්‍රේක් පෑඩ් අළුතින් දැමීම.
- පිටුපස ටයර් යුගලය හා බ්‍රේක් ඩ්‍රම් යුගලය ග්‍රීස් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.22 QL-2901 දරණ ත්‍රීරෝද රථයෙහි පහත සඳහන් සේවා කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

- ටින්කරින් හා පේන්ට් කිරීම.
- ටෙන්ට් එක අළුතින් දැමීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.23 වරිපනම් අංක 04 සහා නිළ නිවසෙහි ජී.එච්.විජිත මහතා පදිංචිව සිටි කාලයේ ජල හා විදුලි බිල්පත් වල රු.4,945.43 ක මුදලක් හිගව පැවති අතර එම බිල්පත් එන්.සී.කාමිලා මහත්මිය විසින් පියවා ඇති අතර ඉන්පසුව ජී.එච්.විජිත මහතාගෙන් එම මුදල වැටුපෙන් අයකර ආදායමට බැරකර ඇත. එය ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස එන්.සී.කාමිලා මහත්මියට ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.24 බළන්ගොඩ නගර සභාවේ කසළ කළමනාකරණයට සුදුසු වාහනයක් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන තීරණය ලබාගැනීම.

2020-02-11 දිනැතිව බළන්ගොඩ නගර සභාවේ පවත්වන ලද මහ සභාවේ තීරණය කළ පරිදි 2020-03-03 දිනැතිව මෙම සභාවේ පවත්වන ලද කර්මාන්ත කමිටුවට කසළ කළමනාකරණයට සුදුසු වාහනයක් ලබා ගැනීමට මිළ ගණන් ඉදිරිපත් කර තිබූ Ideal Motors ආයතනයේ නිළධාරි මහතෙකු ගෙන්වා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ වාහන පිළිබඳ විස්තර ලබා ගන්නා ලදී. අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද විස්තර ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම විස්තර සැලකිල්ලට ගෙන

Model -Mahindra Big Bolero MDI With Ps 2WD-1.7BS IV

Country of Origin – India

Year of Manufacture – 2019

Capacity Of Cab – 9X5 Feet

Weight – 3425Kg

Number of Cylinder – 4

Disel, 2523cc,MD1 4, Cylinder 2.5 L,Turbo Charged Power Steering, Mannual Windows, 5 Forward, Gear 225/80XR16

යන ඉහත මාදිලියේ වාහනය රු.2,345,000.00 ක මුදලකට වාහන ආනයනික සමාගමක් වන Ideal Motors ආයතනයෙන් මිළදී ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.25 බළන්ගොඩ නගර සභාවේ සේවය කරන පහත සඳහන් සේවකයින් සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ටී.ඒ.පේමසිරි
- කේ.ජයකොඩි
- ටී.සුබ්‍රමනියම්
- බී.ආර්.කරුණාදාස
- එන්.බී.ගුණපාල
- කේ.එච්.නිමලදාස
- ඩබ්.බී.සිරිසේන
- කේ.එම්.සම්පත් විජය බණ්ඩාර
- යූ.එම්.උපාලි මුණසිංහ
- ආර්.ජයසුන්දර
- ඩී.ජේ.උපුල් ශාන්ත
- ජී.දයාරත්න
- ඩබ්.ඒ.සමරදාස
- ආර්.ජී.ජයතිලක
- ඩබ්.ඩබ්.ෂෙල්ටන් පීරිස්
- ආර්.එම්.තුසිත ප්‍රසන්න
- සුජිත් මධුරංග
- කේ.ජී.තරිඳු ලක්මාල්
- ධර්මකීර්ති
- එම්.රොෂාන් ප්‍රනාන්දු
- එම්.එස්.අරවින්ද ඉන්දුසිරි
- පී.ත්‍යාගරාජා
- ටී.ඩී.සන්ධ්‍යානි
- එච්.එම්.අනුර ප්‍රේමසිරි
- ආර්.කේ.ඩී.නිලන්ති
- කේ.නාලක

- ආර්.ක්‍රිෂ්ණන්
- ලාල් ගුණරත්න
- එම්.වීරසිරි
- එම්.එම්.ඉරෝෂන් හේමන්ත
- වයි.ඩී.සුදත් සංජය

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.26 2020 වර්ෂය සඳහා වාහන සේවා කිරීම සඳහා මෙම සභාවේ ලියාපදිංචි වී ඇති රිෂානා සර්විස් ආයතනය හා කේ.ඒ.ඔටෝ සර්විස් ආයතනය විසින් ලබා දී ඇති මිළ ගණන් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා නගර සභාව සතු ට්‍රැක්ටර් රථ සියල්ල රිෂානා සර්විස් ආයතනය වෙත යැවීමටත්, ඉතිරි වාහන සියල්ල කේ.ඒ.ඔටෝ සර්විස් ආයතනය වෙත යැවීමත් සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.27 කර්මාන්ත කමිටුව මඟින් නිර්දේශ කරන ලද 2020 මාර්තු මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත කර්මාන්ත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

01. කරව්කැටිය ගල්වල පාර නඩත්තු කිරීම.
02. සුදර්ශනපුර මාර්ගය නඩත්තු කිරීම.(ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.)
03. දෙහිගස්තලාව තලාව මාර්ගය නඩත්තු කිරීම.
04. ලේඩිස්මිත්වත්ත මාර්ගය නඩත්තු කිරීම.
05. බැංකියවත්ත මාර්ගය දෙවනවර තාර දැමීම. (ජල ටැංකිය අසළ සිට ඉදිරියට)
06. අක්කර 18 මාර්ගයේ සමගි මාවත කාණුව සංවර්ධනය කිරීම.
07. කිරිඳිගල මැද පාරේ අවසන් කොටසේ කාණුව සංවර්ධනය කිරීම.
08. බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පූර්ව මිශ්‍රන අංගනයක් ඉදිකිරීම.
09. කොටුගොඩැල්ල, වැකුඹුර,අයි.ජී.ඉලේසිංහ මහත්මියගේ නිවස අසළ පැතිබැම්මේ ඉතිරි

කොටස ඉදිකිරීම.

10. බස්නැවතුම්පලේ මුරකුටියක් සහ නව කඩ කාමරයක් ස්ථාපිත කිරීම.

11. සඳුන්ගම පාර දෙවන වර තාර දැමීම.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය**

| | |
|---|---|
| තාර බැරල් | 100 |
| 1 1/2 ගල් කියුබ් | 15 |
| මි.මී.10 කම්බි | 200 |
| චිප් ගල් කියුබ් | 15 |
| සිමෙන්ති | 50 |

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

දිනකට සේවකයින් 15 බැගින් දින 25කට කම්කරුවන් 375 ක් අවශ්‍ය වේ.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන**

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 20 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සෑම මසකම පළමු බදාදා කර්මාන්ත කමිටුව පැවැත්වීම සඳහා සභාවෙන් තීරණයක් ගත් නමුත් 2020 මාර්තු මස කර්මාන්ත කමිටුව මාර්තු මස පළමු අඟහරුවාදා දින පැවැත්වීම නිසා එයින් තමන් හට නිවාඩු අනුමත කර ගැනීමට නොහැකිව අපහසුතාවයකට පත්වූ බවත් නැවත වතාවක් මෙවැනි දෙයක් සිදු වීමට ඉඩ නොතබන ලෙසත් සභාවෙන් ගත් තීරණයට පටහැනිව ක්‍රියා නොකරන ලෙසත් පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, මාර්තු මස කර්මාන්ත කමිටුවේදී ගරු මන්ත්‍රීවරුන් සඳහා ලබා දෙන මන්ත්‍රී ප්‍රතිපාදන පිළිබඳව තීරණයක් ගැනීම සඳහා ගණකාධිකාරිතුමා කර්මාන්ත කමිටුවට සහභාගි කර ගැනීමට අවශ්‍යව තිබූ අතර එතුමාට බදාදා දින නොහැකි වූ බැවින් අඟහරුවාදා දින කර්මාන්ත කමිටුව පැවැත්වූ බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.28 පුස්තකාල උපදේශක කමිටු රැස්වීම මගින් නිර්දේශ කරන ලද යෝජනා

- ලංකාවේ ප්‍රථම සහ එකම ස්මාර්ට් ලයිබ්‍රරිය අප පුස්තකාලය තුළ ස්ථාපිත කිරීම. (මේ සඳහා රු.600,000.00 ක මුදලක් වැය වේ.)
- බැහැර දෙන අංශය වායු සමීකරණය කිරීම සහ එහි ආරක්ෂිත කැමරා සවි කිරීම.
- ඩිජිටල් පුවරුවක් මගින් පුස්තකාලයේ සේවාවන් පිළිබඳ තොරතුරු ඇතුළත් ත්‍රෛමාසික සඟරාවක් නිකුත් කිරීම සහ සාමාජිකත්වය ලබා දෙන අවස්ථාවේදී පුස්තකාලයේ නීති රීති ඇතුළත් අත් පොතක් ලබා දීම.
- විමර්ශන අංශය පිටුපස වහලයේ සිවිලිම ගැසීම.
- පුස්තකාලය ඉදිරිපිට සාදන ලද පොකුණට දිය ඇල්ලක් සවි කිරීම. ( මේ සඳහා රු.25,000.00 ක පමණ මුදලක් වැයවේ. )
- පාඨකයින් සඳහා දැනට වෙන්ව පවතින වැසිකිළිවල දොරවල් දිරාපත් වී ඇති බැවින් ඇලුමිනියම් දොරවල් 02ක් සවිකිරීම.
- පුස්තකාලයට ලබා දුන් ඡායා පිටපත් යන්ත්‍රයෙන් පාඨකයා ලබා ගන්නා එක් ඡායා පිටපත් කොළයක් සඳහා රු.5.00 ක මුදලක් අය කර ගැනීම.

<u>**පුස්තකාලයට ලබා ගත යුතු භාණ්ඩ**</u>

- ✓ බැහැර දෙන අංශයට ලී රාක්ක 04 ක් ලබා ගැනීම.
- ✓ කියවීම් ශාලාවට වෝල් ෆෑන් 04 ක් ලබා ගැනීම සහ විමර්ශන අංශය වායු සමීකරණය කිරීම.
- ✓ ළමා අංශයට බිත්ති රාක්ක 02 ක් සහ කරකැවීමට හැකි පොත් රාක්ක 04ක් ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ඉහත සඳහන් කරන ලද සියලු යෝජනා ඉටු කළ යුතු බවත්, පුස්තකාල සහයිකා අනුලා කහංගම මහත්මිය විසින් ඇය කියවීම් ශාලාවෙන් ඉවත් කර මහජන පුස්තකාලය වෙත අනුයුක්ත කරන ලෙස හෝ පුස්තකාල කාර්ය මණ්ඩලය මාරු කරමින් කියවීම් ශාලාව වෙත යවන ලෙස දන්වා සභාවට ලිපියක් ඉදිරිපත් කර ඇති බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.29 පොදු වෙළෙඳසැල අංක 03 හා 04 දරණ කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් මේ සඳහා විවෘත ටෙන්ඩර්පත් කැඳවීමට අවශ්‍ය නොවන අතර සීමිත ටෙන්ඩර්පත් කැඳවා ටෙන්ඩර් කරන ලෙසත් දැනට අයකරන මුදලින් 25% ක මුදලක් අඩුකර අවම ලංසු මුදල ඉදිරිපත් කිරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.30 පෞද්ගලික බස් ගාල් ගාස්තු ටෙන්ඩරයේ නිවාඩු දින සඳහා ගාස්තු නිදහස් කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සෑම මසකම පොහොය දිනයන්හි දී හා මැයි 01 යන දිනයන්හිදී ගාස්තුවෙන් 50% ක මුදලක් නිදහස් කිරීමත් , අප්‍රේල් 13,14 වන දින ගාස්තුවෙන් සම්පූර්ණයෙන් නිදහස් කිරීමටත් සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා ගෙනා යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.31 කාර්පාක් අංක 04 කඩ කාමරයේ බදු අයිතිය සංශෝධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා මෙම කඩ කාමරයේ බදු අයිතිකරු වන බී.කේ.ජිනදාස මහතා මියගොස් ඇති බැවින් ඔහුගේ බිරිඳ වන ඒ.කල්‍යාණි විජේතුංග යන අය වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එසේ ලබා දීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.32 සෞඛ්‍ය කම්කරුවන් සඳහා වෛද්‍ය සායනයක් පැවැත්වීම සඳහා වන රු.58,000.00 වියදම් ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.33 බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය සඳහා දැල් ආවරණ දෙකක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.34 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.35 කුමාර විද්‍යාල පාර කාණුව සඳහා කොන්ක්‍රීට් ආවරණ සෑදීමට අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| 12mm කම්බි | 220 |
| සිමෙන්ති මිටි | 50 |
| 3/4 ගල් කියුබ් | 03 |
| වැලි කියුබ් | 02 |
| පොලිතීන් කිලෝ | 10 |
| 6" ලෑලි අඩි | 300 |
| බයින්ඩින් කම්බි | 10 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.36 බස්නැවතුම්පල ට්‍රාන්ස්පෝමරය විතැන් කිරීම සඳහා වියදම් වන රු.92,000.00 ක මුදල විදුලි බල මණ්ඩලය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07.01 ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

07.01.01 හුනුකුඹුර සුනිල් ගරාජය ඉහල මාර්ගයේ ඇති නිවාස 7-8 පමණ අවදානම් සහිත විශාල බෝ ගස කපා ඉවත් කර දීමට අවශ්‍ය කටයුතු සලස්වා දීම.

07.01.02 ආනන්ද මෛත්‍රී මාවත මාර්ගයෙහි කාණු විධිමත් භාවයක් නොමැති නිසා මාර්ගය දෙපස ජලය රැඳී පවතින බැවින් එම කාණු පද්ධතිය නඩත්තු කරදෙන මෙන් ඉල්ලා සිටීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය මෙම බෝ ගස නිසා නිවාස 7-8 කට යාම සඳහා ඇති මාර්ගය අවහිර වී ඇති බව ද ආනන්ද මෛත්‍රී මාවත මාර්ගය දෙපස ජලය රැඳී පවතින බැවින් එම කාණු පද්ධතිය නඩත්තු කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07.02.01 මොහාන් සාලිය එල්ලාවල මාවත සහ බාන්ස් රත්වත්ත මාවත හඳුනා ගැනීම සඳහා ඩිජිටල් නාම පුවරු සවිකිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.03 ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය**

07.03.01 ප්‍රාර්ථනා බෝධියට පිවිසුම් මාර්ගය නගර සභාවට පවරා ගෙන එය සංවර්ධනය කරදීම.

07.03.02 මෙම සභාව විසින් මාර්ගයේ කණු ඉවත් කිරීමට අදාළ ආයතන දැනුවත් කල ද සති 02 කට ඉහතදී මුගුණමල මාර්ගයේ අනතුරුදායක ස්ථානයක ටෙලිකොම් කණුවක් මාර්ගය අයිනක සිටුවා ඇත. සභාවේ අනුමැතියකින් තොරව මාර්ගය ආසන්නයේ කණු සිටුවීම සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ යම් එකඟතාවයකට පැමිණීම යෝජනා කරමි.

07.03.03 නුගමුලහේන මාර්ගයේ යසවතී හෙට්ටිආරච්චි මහත්මියගේ නිවස අසළ මාර්ගය අවහිරවන ලෙස පිහිටා ඇති මහෝගනී ගස් 02 කපා ඉවත් කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.04 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

07.04.01 පහළ කිරිමැටිතැන්න ඉක්බාල් මහතාගේ නිවස අසළ ඉඩම මැදින් ගලා බසින වතුර බැසීම සඳහා බෝක්කු පද්ධතියක් සකස් කිරීම.

07.04.02 ගොරොක්ගහමඩ බෙතෙල්හිල් මාවත උඩ කොටස පසුගිය ඇඳහැලුණු වර්ෂාව නිසා කඩා වැටී ඇති පස් කන්ද ඉවත් කර මාර්ගය පිළිසකර කිරීම.

07.04.03 කල්තොට පාර අතුරු මාර්ග වන කහටගහවත්ත පාර,ෆලීල් හාජ්ජියාර් මාවත, පල්ලිය ඉදිරිපිට වටරවුම් පාර, බෙතෙල්හිල් පාර, දුනුමඩලගහවත්ත පාර, සමගි මාවත, විද්‍යාල වටරවුම් මාවත, දෙහිගස්තලාව පළමුවන හා දෙවැනි පටුමග, ලංකාභරණ මාවත, තොටුපලතැන්න මාවත හා තලාව පාර නාම පුවරු සවි කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් ගොරොක්ගහමඩ බෙතෙල්හිල් මාවත උඩ කොටස පස් කන්ද ඉවත් කිරීම සඳහා එක් දිනක් පමණක් ගත වන බවද ඉක්බාල් මහතාගේ නිවස අසළ ඉඩම මැදින් ගලා බසින වතුර බැසීම සඳහා බෝක්කු පද්ධතියක් සකස් කර දෙන ලෙසද පවසන ලදී

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

***08. කර්මාන්ත කමිටුව මගින් නිර්දේශ කරන ලද යෝජනා***

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුන් සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබා දෙන රු.800,000.00 ක මුදල යොදා සිදු කරන මෙම කර්මාන්ත හා ලබා දෙන උපකරණ සඳහා වැය කරනු ලබන්නේ මහජනතාවගේ බදු මුදල් බව, බදු මුදල් නොගෙවන මහජනතාවට පසක් කර දීම උදෙසා හා මෙම කාර්යයට වැදගත්කමක් ලබා දීම සඳහා කර්මාන්ත හෝ උපකරණ ජනතා අයිතියට පත් කිරීමේදී එම අවස්ථාවට සහභාගි වීම සඳහා තමන් දැනුවත් කරන ලෙස පවසන ලදී.

**08.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

08.01.01 පල්ලෙකුඹුර මාර්ගයේ පළවන පටුමඟ කාණුවේ ඉතිරි කොටස් යොදා මාර්ගය සංවර්ධනය කිරීම. රු.500,000.00

(ඉහත කර්මාන්තය ලබා දීම - ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය - කුමාරගම, බළන්ගොඩ)

08.01.02 කරව්කැටිය මාර්ගයේ වම්පසට ඇති දෙවන අතුරු මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම. රු.300,000.00 (ඉහත කර්මාන්තය ලබා දීම - ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය - කුමාරගම,බළන්ගොඩ)

08.01.03 පොදු වෙළෙඳසැල නවීකරණය කිරීම.

08.01.04 ලංකා බැංකුව ඉදිරිපිට වාහන නැවැත්වීම තහනම් ප්‍රදේශයක් ලෙස නම් කිරීම.

08.01.05 ලංකා බැංකුව හා කොමර්ෂල් බැංකුව පිටුපස ඉඩම (මාසික ගාස්තුවක් ගෙවා) ලබාගෙන රථගාලක් ලෙස සකස් කිරීම.

08.01.06 පැරණි පදික කඩ ඉදිරිපිට ගණුදෙනුකරුවන් සඳහා වෙන්වුණු රථගාලක් සකස් කිරීම.

08.01.07 නගරයේ සෑම ත්‍රිරෝද රථගාලක් සඳහා උපරිමය 05 ක සීමාවකට යටත්ව සීමා ලකුණු කර සකස් කරදීම.

08.01.08 පිට්ටනිය වටරවුම් පාර ( ළමා උද්‍යානය අසල සිට නව බස්නැවතුම්පොළ දක්වා ) මාර්ගය පස් දමා සකස් කිරීම.

ඉහත යෝජනා ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.02 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

08.02.01 අක්කර 18 මැණික් සර්ගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම. රු.300,000.00

08.02.02 ජෙයිලානි ජාතික පාසල් මාර්ගයේ අවසන් කොටස සංවර්ධනය කිරීම. රු.500,000.00

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා පවසා සිටියේ තමන්ගේ ඉහත යෝජනා දෙක සංශෝධනය කර පහත සඳහන් යෝජනා ඉටු කිරීමට අවශ්‍ය බවයි.

- ඒ විලියම් මාවත රණවක මහතාගේ නිවස අසළින් යන මාර්ගය සංවර්ධනය කිරීම

(ඉහත කර්මාන්තය ඉටු කිරීම - දුනුමඩලගහවත්ත ප්‍රදේශවාසීන්ගේ සුභ සාධක සමිතිය)

- හැපි කිඩ්ස් පෙර පාසලට රු.50,000.00 ක ආධාර ලබා දීම.
- රිෂාලා සමාජ සේවා සුභ සාධක සමිතියට රු.50,000.00 ක ආධාර ලබා දීම.

- අල් ඊමාන් පෙර පාසලට රු.50,000.00 ක ආධාර ලබා දීම.

ඉහත යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.03 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

08.03.01 කිව්ලේවෙල කොන්ක්‍රීට් කාණුවේ ඉතිරි කොටස ඉදිකිරීම. රු.100,000.00

(ඉහත කර්මාන්තය ලබා දීම - තුඹගොඩ සුහසරණ සමිතිය)

08.03.02 කිව්ලෙවෙල මස්සැන්න මාර්ගය යා කෙරෙන පාලම ඉදිකර සංවර්ධනය කිරීම. රු.500,000.00

08.03.03 සඳුන්ගම පඩිපෙළ හා බැම්ම සෑදීම. (ඩොලන්සෝමේගේ පාර) රු.200,000.00

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.04 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

08.04.01 කිරිඳිගල අනඳමෙත්ගම රබර්වත්ත සියඹලාගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. රු.500,000.00

08.04.02 කිරිඳිගල අනඳමෙත්ගම ප්‍රජාශාලාව අසළ සිට නුගමුලහේන දෙවන පටුමග කොටසක් කොන්ක්‍රීට් කිරීම.

08.04.03 කිරිඳිගල ග්‍රාම නිළධාරි කාර්යාලයට වැසිකිළියක් හා ජලය ලබා දීම.

(ඉහත යෝජනා 02 මන්ත්‍රී ප්‍රතිපාදන රු.300,000.000 සිදු කරන බව සඳහන් කරන ලදී.)

(ඉහත කර්මාන්ත ලබාදීම - කිරිඳිගල ශ්‍රම උදාන සමිතිය)

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.05 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

08.05.01 ඕලුගංතොට සියඹලාගහවත්ත කුමාර මහතාගේ නිවසට යන පාරේ පාලම ඉදිකිරීම. රු.200,000.00

08.05.02 ඕලුගංතොට සුසාන භූමියට ප්‍රවේශවන මාර්ගය දෙවන අදියර කොන්ක්‍රීට් කිරීම. රු.200,000.00

08.05.03 ඕලුගංතොට ගමගෙදර පාර ඉන්ද්‍රානි ලියනගේ මහත්මියගේ නිවසට යන මාර්ගය හා පැති බැම්ම සකස් කිරීම. රු.100,000.00

08.05.04 ඕලුගංතොට පුරණ ගෙදර පාරේ ලලිත් මහතාගේ නිවසට යන මාර්ගය සහ බෝක්කුව සංවර්ධනය කිරීම. රු.200,000.00

08.05.05 කිරිඳිගල වංගුගෙදර අසලින් වලවේ ගඟේ නාන තොටුපලළට පිවිසෙන පඩිපෙළ සංවර්ධනය කිරීම. රු.100,000.00

08.05.02 යෝජනාව හා 08.05.05 ඉවත් කර පහත සඳහන් යෝජනාව ඉටු කිරීම අවශ්‍ය බව පවසන ලදී.

- ඕලුගංතොට ලියනගේ මහත්මියගේ නිවස අසළ පැති බැම්මි ඉදි කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.06 ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

08.06.01 හුණුකුඹුර පාරේ පළමුවන පාලම අසළ පැතිබැම්ම ඉදිකිරීම. රු.800,000.00

(ඉහත කර්මාන්තය ලබා දීම - ශ්‍රී මුතු සුහසාධක සමිතිය)

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.07 ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය**

08ඃ07ඃ01 සෝමා කන්දෙගෙදර මහත්මියගේ නිවෙස්වලට යන මාර්ගය සංවර්ධනය කිරීම. රු.150,000.00

08ඃ07ඃ02 දොරවෙල සිසිර මහතාගේ නිවෙස්වලට යන මාර්ගය සංවර්ධනය කිරීම. රු.150,000.00

08ඃ07ඃ03 අනඳමෙත්ගම යසවතීහෙට්ටිආරච්චි මහත්මියගේ නිවෙස්වලට යන මාර්ගය සංවර්ධනය කිරීම. රු.250,000.00

08.07.04 බිංදු මහතාගේ නිවස අසළ සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම. රු.250,000.00

(ඉහත කර්මාන්ත ලබා දීම - එක්සත් සමිති සුහසාධන සමිතිය - මුගුණමලේ, බළන්ගොඩ)

08.07.05 දොරවෙල බුදුමැදුර ඉදිරිපිට මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම.

08.07.06 අනඳමෙත්ගම දෙවන පටුමගේ ඩෙංගු බෝවන ස්ථානයට පස්දමා ඊට ඉහළින් කොන්ක්‍රීට් යෙදවීම.

08.07.07 ශෛලතලාරාම මාර්ගයේ උඩගම ප්‍රදේශයට යන කොටස නඩත්තු කිරීම.

08.07.08 මුගුණමලය ගලපල්ලෙඅරාවට හැරෙන ස්ථානයේ සිට පහළට දඹගහනවස දක්වා කොටස නඩත්තු කිරීම.

08.07.09 වැලිහරනාව නිශානි නාරංගොඩ මහත්මියගේ නිවසට යන මාර්ගයේ මැද කොටස නඩඩත්තු කිරීම.

08.07.10 රොබිසන් ප්‍රනාන්දු මහතාගේ නිවස අසළ සිට ජල සම්බාදන මණ්ඩලයට හැරෙන ස්ථානය දක්වා වූ කොටසේ කාණු පද්ධතිය සකස් කිරීම.

08.07.11 දඹගහනිවස අසල මාර්ගයේ ආරක්ෂාවට පැති බැම්ම ඉදි කිරීම.

08.07.12 ගලපල්ලෙඅරාවට හැරෙන ස්ථානයේ ඇති බෝක්කුව පස්පිරී ඇති බැවින් සුද්ධ කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනඳමෙත්ගම යසවතී හෙට්ටිආරච්චි මහත්මියගේ නිවෙස්වලට යන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෙදවීමට බලාපොරොත්තු වූ රු.250,000.00 මුදල රු.200,000.00 දක්වා අඩු කිරීමට අවශ්‍ය බවත්, බිංදු මහතාගේ නිවස අසළ සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම යෙදවීමට බලාපොරොත්තු වූ රු.250,000.00 මුදල රු.200,000.00 දක්වා අඩු කිරීමට අවශ්‍ය බවත්, ඉතිරි මුදල එක්සත් සමඟි සුහසාධක සංගමයට උපකරණ මිළදී ගැනීම සඳහා යොදවන ලෙසත් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.08 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

08.08.01 දුනුමඩලගහවත්ත මාර්ගයේ සහ ජාතික පාසල පිටුපස කොටසේ පළුදු වී ඇති කොටස් පිළිසකර කර කථිකාචාර්ය පතිරණ මහතාගේ නිවස අසළ සිට පුංචිහේවා මහතාගේ නිවස දක්වා ඇති කොටසේ කාණුවක් සකස් කිරීම.

(ඉහත කර්මාන්තය ලබා දීම - කුමාරගම අනඳමෙත් ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය- )

08.08.02 කුමාරගම අනඳමෙත් ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය සඳහා ශබ්ද විස්තාරණ යන්ත්‍රයක් (බෆල් එකක්) ලබාදීම.

08.08.03 තුඹගොඩ ජයන්ති මාවත එකක්සත් සංසඳය සඳහා හට් එකක් ලබා දීම.

08.08.04 දුනුමඩලගහවත්ත ප්‍රදේශවාසීන්ගේ සුභසාධක සංගමය සඳහා ප්ලාස්ටික් පුටු 40ක් ලබා දීම.

(ඉහත යෝජනා 03 මන්ත්‍රී ප්‍රතිපාදන රු.300,000.000 සිදු කරන බව සඳහන් කරන ලදී.)

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා පහත සඳහන් යෝජනාව ද ඇතුළත් කළ යුතු බව පවසන ලදී.

- කුමාරගම පොදු සුසාන භූමියේ ඇති සොහොන් ගෙයි වහල අළුත්වැඩියා කිරීම

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.09 ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

08.09.01 තුඹගොඩ මහ පන්සල කාණු පද්ධතිය පිළිසකර කිරීම. රු.500,000.00

08.09.02 ජොන්සන් මහතාගේ නිවස ඇතුළු නිවාස 10ක් සඳහා යන මාර්ගය පඩිපෙල් දමා සංවර්ධනය කිරීම. රු.100,000.00

08.09.03 කිරිඳිගල වැලිහරනාව පාරේ කුරේ මහතාගේ නිවස ඉදිරිපිට (මීටර් 50ක් පමණ) මාර්ගය සංවර්ධනය කිරීම.

08.09.04 උඩකන්ද යූ.කේ.ෆයර් යෞවන සමාජය සඳහා හට් 01ක් සහ පුටු ලබාදීම.

08.09.05 බළන්ගොඩ රෝහලේ බල්ලන්ගෙන් වන හානිය, නොදිරන ද්‍රව්‍ය නිසි පරිදි ඉවත් කිරීම, කෑම වර්ග සතුන් සඳහා ගෙනයාම සම්බන්ධව සභාවට ඉදිරිපත් කිරීම.

08.09.06 දනට මූලික රෝහලේ විශාල අඩුපාඩු රැසක් ඇත. ඒ සම්බන්ධව සභාව දනුවත් කීමට අවශ්‍ය කටයුතු කිරීම.

08.09.07 පසුගිය මාස කිහිපයක සිට සභාව ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.10 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

08.10.01 පසුගිය කාලයේ මහ සභාව විසින් ඇස්තමේන්තු අනුමත කළ දෙණියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාර ඉතිරි කොටස පැති බැම්ම සකසා කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම. රු.500,000.00

08ඃ10ඃ02 පල්ලෙවෙල වෙල අද්දර මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම.

08ඃ10ඃ03 පුවක්ගහමුල්ල පාරේ අතුරු මාර්ගයක් වන මහේෂ් ඉමන්ත මහතාගේ නිවසට සහ තවත් අයගේ නිවාසවලට යන මාර්ගය සංවර්ධනය කිරීම.

08.10.04 පල්ලෙවෙල පාරේ කාණු පද්ධතිය පිළිසකර කිරීම.

08.10.05 බුලත්ගම විද්‍යාලයට පානීය ජලය ලබා දීම.

08.10.06 වැවවත්ත ළමා සුරකුම් මධ්‍යස්ථානයට විදුලිය ලබාදීම.

08.10.07 දෙණියකුඹුර අභිමානි සුභ සාධක සංගමය වෙත ආහාර පිළිගැන්වීමේ කට්ටලයක් (බුෆේ සෙට්) එකක් ලබා දීම.(පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන)

08.10.08 තුඹගොඩ ව්‍යාපාරික මිත්‍රත්ව පදනම වෙත පොදු කටයුතු වලදී භාවිතා කිරීමට කොඩි කණු 20 ක් ලබා දීම. (පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන)

08.10.09 පල්ලෙවෙල එක්සත් මරණාධාර සමිතියට ශබ්ද විකාශන යන්ත්‍රයක් ලබා දීම.(පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන)
(ඉහත කර්මාන්ත ලබා දීම- ජයන්ති මාවත එක්සත් සංසඳය)

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.11 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

08.11.01 වතුකාරගොඩ බේබි ආච්චිගේ කඩය අසළ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සහ පැතිබැම්ම ඉදි කිරීම.

08ඃ11ඃ02 පූජා පිටිය ගුණපාල මහතාගේ නිවසට හා අනෙකුත් නිවාසවලට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම

08፥11፥03 මිරිස්කොටුව ජයතිලක මහතාගේ නිවසට හා අනෙකුත් නිවාසවලට යන මාර්ගය කොන්ක්‍රීට්

08፥11፥04 බෝම්බුව විමලසේන මහතාගේ නිවස අසළ මාර්ගය කොන්ක්‍රීට් කිරීම.

08.11.05 බෝම්බුව මෙත්සිත් සුභසාධක සංගමය හා මරණාධාර සමිතියට ප්ලාස්ටික් පුටු 60ක් ලබා දීම.

08.11.06 පෙට්ටිගල පාර පූජාපිටිය සිරිල් මහතාගේ නිවසට යන පාර

08.11.07 පරගහකුඹුර පාර සමෘද්ධි නිළධාරි චන්ද්‍රසිරි මහතාගේ නිවස අසළ පැති බැම්ම ඉදිකර වර්ෂාවට ගලා ගිය පාර අළුත්වැඩියා කිරීම.

08.11.08 කොටුගොඩැල්ල උඩකන්ද පහළ පාර සම්බන්ධ කර සංවර්ධනය කිරීම.

(ඉහත කර්මාන්ත ඉටු කිරීම - සුහද වැඩිහිටි සමිතිය - බෝම්බුව)

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.12 ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා**

08፡12፡01 උඩ ඇල්ලෙපොල සරස්වතීවත්ත "සමගි" අවමංගල්‍යාධාර සමිතිය මගින් ඉදි කර ඇති දෙමහල් ගොඩනැගිල්ලේ බිම් මහලේ ඉතිරි වැඩ නිමකිරීම. රු.300,000.00

08.12.02 කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගයේ ඇල්ලේපොල සුසාන භූමියට පිවිසෙන පිටගැටපෙළ අසළ බදුල්ල දෙසට ගමන් කරන මගීන් වෙනුවෙන් බස් හෝල්ට් එකක් ඉදිකිරීම. රු.250,000.00

08.12.03 කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගයේ වෙළගේ පන්සල අසල කොළඹ දෙසට ගමන් කරන මගීන් වෙනුවෙන් බස්හෝල්ට් එකක් ඉදි කිරීම. රු.250,000.00

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.13 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

08፥13፥01 නගරයේ සිරි වීරසුන්දරාරාමයේ ඉදිකරනු ලබන බැම්මට සිමෙන්ති කොට්ට 50 ක් ලබා දීම. රු.50,000.00

08፥13፥02 ජල ටැංකිය අසළ දේශබන්දු මහතාගේ නිවෙස අසලින් දිවෙන අතුරු මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම. රු.100,000.00

08፥13፥03 බලගහමුල සේනක පෙදෙසේ අවිහිංසා සහන සංවිධානයට හට් එකක් ලබා දීම. රු.45,000.00

08፥13፥04 ගොරොක්ගහමඩ ජුම්මා දේවස්ථානයේ කොටසක් කොන්ක්‍රීට් කර දීම. රු.50,000.00

08:13:05 දෙවට පාරේ මල්ලිකා මහත්මියගේ ගෙවල්වලට යන මාර්ගය අඩි 03 ක් පලළට මීටර් 30ක් කොන්ක්‍රීට් කරදීම. රු.100,000.00

08:13:06 සේනක පෙදෙසේ මාර්ගයේ වාහන නැවැත්වීමට සහ අයින් කිරීමට ඇති එකම ස්ථානය දයානි /රුවන් /සුදු රාජාගෙ නිවෙස් ඉදිරිපිට කොන්ක්‍රීට් කර දීම සහ කාණුව සකස් කිරීම. රු.230,000.00

08.13.07 ජුම්මා දේවස්ථානයට, අවිහිංසා සංවිධානයට සහ නගරයේ වෙළෙඳ සංගමයට පුටු 25 බැගින් ලබා දීම. රු.75,000.00

08.13.08 අවිහිංසා සංවිධානයට සහ වෙළෙඳ සංගමයට බඟල් ලබා දීම. රු.60,000.00

08.13.09 බළන්ගොඩ තානායමට පිවිසෙන ස්ථානයේ ඉතිරිව ඇති බැම් කොටස සකස් කිරීම. රු.35,000.00

(ඉහත කර්මාන්ත ඉටු කිරීම - එකමුතු ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිතිය)

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:14 ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

08:14:01 හුනුකුඹුර දෙල්ගස්වත්ත මාර්ගයේ කේ.එල්.එන්.නිශාන්ත මහතාගේ නිවස අසළ සිට කේ.එල්.එන්. සරත් කුමාරසිරි මහතාගේ නිවස දක්වා මීටර් 70 පමණ දුරක් ඉතාම අබලන්ව තත්වයේ පවතින බැවින් මෙම පාර කාණුව සමඟ කොන්ක්‍රීට් කිරීම. රු.325,000.00

08:14:02 හුණු කුඹුර ගම බළන්ගොඩ ගෙදර යූ.ඒ. නිශ්ශංක ප්‍රියන්ත කුමාර මහතාගේ නිවස අසළ සිට් ශීලා නිකලන්ද මහත්මියගේ නිවස දක්වා පාර ඉතාම අබලන් තත්වයේ පවතී. මෙම කොටස මීටර් 80 පමණ ඇති බැවින් කාණුව සමඟ පාර කොන්ක්‍රීට් කිරීම. රු.300,000.00

08.14.03 හුණුකුඹුරගම සුනිල් ගරාජය අසළ මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම. රු.175,000.00

(ඉහත කර්මාන්ත ඉටු කිරීම - හුනුකුඹුර ජලබල එකමුතු සුභසාධක සමිතිය)

08.14.04 හුණුකුඹුර රොෂාන් කැලිස්ටස් මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ පාර සංවර්ධනය කිරීමට බැම් සකස් කර ඇති නමුත් මාර්ගයේ ගමනාගමනය අපහසු බැවින් පස් ඉවත් කර මාර්ගය ගමන් කිරීමට සුදුසු තත්ත්වයකට සංවර්ධනය කර දීම.

08.14.05 කෝපිවත්ත මාර්ගයට පිවිසෙන මංසන්ධියේ කඩාවැටී ඇති කොටසට ස්ලැබ් එකක් දමා යථා තත්ත්වයට පත්කිරීම.

08.14.06 ආනන්ද මෛත්‍රීය මාවතේ සිට හුණුකුඹුර දෙසට ගමන් කරන මාර්ගයේ "කෝපිවත්ත" නාම පුවරුව ප්‍රතිසංස්කරණය කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රපතා මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රසාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.15 ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

08.15.01 ෆලීල් හාජ්ජියාර් මාවත ඉහළ කොටස අබලන්වී ඇති බැවින් සංවර්ධනය කිරීම. රු.500,000.00

08.15.02 මිරිස්වත්ත, අල් ඊමාන් සහ අල් ඉනාමියා පෙරපාසලයට සහ දෙහිගස්තලාව දාරුල් හික්මා පෙර පාසලට ළමා ඩෙස් බංකු කට්ටල ලබා දීම.

08.15.03 ගොරොක්ගහමඩ දුනුමඩලගහවත්ත මාර්ගය අළුත්වැඩියා කිරීම.

08.15.04 කහටපිටිය පාර මුස්තාපා මාවත අබලන් වී ඇති කොටස කඩිනමින් අළුත්වැඩියා කිරීම.

08.15.05 දෙහිගස්තලාව ටකරන් කඩේ අසළ මහවත්තට පිවිසෙන මාර්ගය (නගර සභා සීමාව) කඩිනමින් අළුත්වැඩියා කිරීම.

(ඉහත කර්මාන්තය ලබා දීම - දුනුමඩලගහවත්ත සුභ සාධක සමිතිය)

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා ඉහත කර්මාන්ත ඉටු කිරීමට බාන්ස් රත්වත්ත මාවත, බළන්ගොඩ ලිපිනයෙහි ඇති ග්‍රාම නිළධාරීන්ගේ සුභ සාධක සමිතිය වෙත ලබා දෙන බව පවසන ලදී.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.
**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.16 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

08.16.01 සියඹලා ගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම රු.300,000.00

08ඃ16ඃ02 ඕලුගංතොට එගොඩවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. රු.200,000.00

08.16.03 පුරණගෙදර මාර්ගයේ සංජීව මහතාගේ නිවස අසල පැති බැම්ම ඉදි කිරීම. රු.300,000.00

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:17 ගරු නාගරික මන්ත්‍රීනි එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය**

08:17:01 බළන්ගොඩ උඩ ඇල්ලෙපොල සරස්වතී පාර පිහිටි සුසාන භූමියෙහි පිහිටි කුඩා ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම.
(කර්මාන්තය ඉටු කිරීම - සමගි අවමංගලයාධාර සමිතිය උඩ ඇල්ලෙපොල, බළන්ගොඩ)

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**කර්මාන්ත කමිටුව මඟින් නිර්දේශ වූ වෙනත් යෝජනා**

- ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ ඉල්ලීමක් අනුව ඕළුගංතොට වෙස්ටර්න් හෝටලය ඉදිරිපිට කාණුවේ පස් පිරී ඇති බැවින් එය යථා තත්ත්වයට පත්කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම.
- ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා දැන්වූ පරිදි එච්.එල්.ඩබ්.ගරාජයට යාබද ඉඩමේ ගෙපළ කැපීමේදී මාර්ගය ආසන්නයටම ඉවුර කපා ඇති හෙයින් මාර්ගයේ ගමන් කරන ජනතාවට ඉතා අවධානම් තත්ත්වයක් මතුවී ඇති නිසා ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම.
- එමෙන්ම බොහොමයක් මාර්ගයන්හි නාම පුවරු නොමැති බැවින්, එය කඩිනමින් සකස් කළ යුතු හෙයින් ආයතනයක සහයෝගය ලබාගෙන නාම පුවරු සකස් කිරීම.
- ලේඛනාගාරයේ ජනෙල් සඳහා ග්‍රිල් සවිකිරීම.

ඉහත යෝජනා ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා, අයවැයක් සැදීමේදී ගරු මන්ත්‍රීවරුන් යෝජනා ලබා දෙන්නේ හොඳින් සිතා බලා වන නමුත් ගරු මන්ත්‍රීවරුන් මන්ත්‍රී ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ලබා දී තිබෙන යෝජනා අයවැය ලේඛන තුළ අඩංගු යෝජනා නොවන බවත්, එසේනම් අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේ ප්‍රයෝජනයක් නොමැති බව තමන් සිටිනා ස්ථාවරය බව පවසන ලදී.

අනතුරුව අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අයවැයෙහි අඩංගු නොවන යෝජනා ඉටුකිරීමේදී අයවැය අතුරු සම්මත ගිණුමක් සම්මත කර ගැනීම අවශ්‍ය නොවේද යන්න විමසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා සභාවෙන් සම්මත කර ගත් පසු අවශ්‍ය යෝජනා ක්‍රියාත්මක කළ හැකි බවද අවශ්‍ය නම් අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන ලෙසත් එයට සහයෝගය ලබා දෙන බවත් පවසන ලදී.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ගරු සභාපතිතුමාගේ පක්ෂ ආණ්ඩුව පැවති සමයේ තම කණ්ඩායමට කිසිඳු ප්‍රතිපාදනයක් නොදුන් බව ද එම කාලයේ සිදු කළ දේ සිහිපත් කිරීමට කැමති බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී පී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් තමන් සභාවේදී නිරන්තරයෙන්ම එගොඩ හුණුකුඹුර මාර්ගය අබලන් වී ඇති බැවින් සකස් කර දෙන ලෙස පැවසූ බව ද තවමත් බළන්ගොඩ නගර සභාවේ බලය එක්සත් ජාතික පක්ෂයට පවතින නමුත් තමන් ගෙන එන යෝජනා නොසළකා හැර ඇති බව සඳහන් කළේය. එමෙන්ම කොට්ඨාශයේ සිටින එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ගේ යෝජනා සමිති හරහා කෙසේ හෝ ඉටු කර දෙන නමුත් තමන් ගෙන එන යෝජනා ඉටු නොකිරීම පිළිබඳ විරෝධතාවය ප්‍රකාශ කරන ලදී. එමෙන්ම එම පිරිස විසින් නගර සභාවේ නිළධාරීන්ට ස්තුති කර දැන්වීමක්ද පළ කර ඇති අතර එවැනි අවස්ථාවලදී කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලෙස තමන් අපහසුතාවයට පත්වන බවද පවසන ලදී. මෙවැනි අවස්ථාවල ගරු සභාපතිතුමා මේ පිළිබඳව හැඟීමෙන් යුක්තව සානුකම්පිතව බලන ලෙස ද මෙවැනි කටයුතු සිදු කිරීමේදී කොට්ඨාශයේ ජනතාව තම කණ්ඩායමට කිසිඳු බලයක් නොමැති බවට හිතන බව ද කොට්ඨාශයේ සංවර්ධනයන් තමන් විසින් නොකරන්නේ මන්දැයි ජනතාව තමන්ගෙන් විමසන බව ද පවසන ලදී. එමෙන්ම සමිතිය මඟින් සිදු කරන අවස්ථාවල දී ගමේ ජනතාව එය සභාව මඟින් ඉටු කිරීමට නොහැකි මන්දැයි තමන්ගෙන් විමසන බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රීතුමිය වැරදි වැටහීමක සිටින බව ද තමන්ගේ දේශපාලන ජීවිතයේ දැකපු හොඳම හා එකමුතුම සුභ සාධක සමිතිය හුණු කුඹුර ග්‍රාමයේ පිහිටා ඇති බව ද පැවසීය. මෙම මාර්ගය ඉදිකිරීම සඳහා මීට පෙර සභාවෙන් මුදල් යොදවා ඇති අතර ජලය ලබා ගැනීම සඳහා මාර්ගය පලුදු කළ විට එම මාර්ගය නඩත්තු කිරීම සඳහා සභාවෙන් නැවත මුදල් යෙදීමට නොහැකි බැවින් සභාවෙන් ගල් රෝල හා තාක්ෂණික දැනුම පමණක් දුන් බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා චන්ද්‍රලතා මන්ත්‍රීතුමියට අසාධාරණයක් සිදු ව ඇති බව පවසන ලදී,

**09. හදිසි යෝජනා**

09.01 හියුම්පයිප්ප ලබා ගැනීම.

| | | |
|---|---|---|
| 01. පොළ අසළ කාණුව සඳහා 8’ බට විශ්කම්භය 1.6 | - | 03 |
| 02. ලංකා බැංකුව අසළ 8’ බට විශ්කම්භය 1.6 | - | 06 |
| 03. බලංගොඩ මහජන ක්‍රීඩා පිටිය අසළ 8’ බට විශ්කම්භය 2.0 | - | 01 |

බළන්ගොඩ නගර සභාවේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය හියුම්පයිප්ප ඉහත පරිදි ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

09.02 මෝටර් ග්‍රේඩරය කුළී පදනම මත ලබා ගැනීම.

බළන්ගොඩ නගර සභාවේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලී පදනම මත ලබා දීමේ දී පැයක් සඳහා රු.2,850.00 ක මුදලක් අය කර ගැනීම සුදුසු බවත්, මෙය දිනකට පැය 6 ක කාලයක් සඳහා අවම වශයෙන් ගෙවීම් කරන ලෙස සබරගමුව පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය මගින් දන්වා ඇති නමුත් දිනකට අවම පැය 06 ක් ලෙස නොව වැඩ කරන පැය ගණනට ගෙවීමට අවසර ඉල්ලා සිටීම.

පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු වැඩ කරන පැය ගණන සඳහා අයකිරීමට තීරණය විය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

09.03 HF-7899 දරණ JCB යන්ත්‍රයේ ඉදිරිපස බකට් එක සඳහා අවශ්‍ය ජැක් එකක් ලබා ගැනීම සඳහා ඇඹිලිපිටිය ඉන්ඩස්ට්‍රීස් ආයතනයෙන් එවා ඇති රු.70,000.00 මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

09.04 ආදායමෙන් ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

රත්මලවින්න, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ඩී.නන්දනී යන විසින් ජල බවුසරය ලබා ගැනීම වෙනුවෙන් ගෙවූ රු.3,300.00 ක මුදල හා වෙලේකුඹුර, මැද්දෙකන්ද, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ජී.මහේන්ද්‍රන් යන අය විසින් ජේ.සී.බී යන්ත්‍රය ලබා ගැනීම සඳහා රු.4,500.00 ක මුදලක් ගෙවා ඇති අතර එම සේවාවන් ලබා නොගත් බැවින් එම මුදල ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **14,676,870.98** |
| වෙනත් ලැබීම් | **3,535,181.42** |
| මුලු ලැබීම් | **17,935,052.40** |
| පුනරාවර්තන වියදම් | **8,810,624.05** |
| වෙනත් වියදම් | **4,948,415.80** |
| මුලු වියදම් | **13,696,039.85** |

**2020-03-01 සිට 2020-03-31 දක්වා ඉන්ධන වාර්තාව**

| **වාහන අංකය** | **මුදල රු.** |
|---|---|
| 227-5020 | 37,960.00 |
| බොබ්කැට් | 41,600.00 |
| GK -1483 | 5,579.00 |
| GK -6227 | 12,235.00 |
| HF -8558 | 14,835.00 |
| තෙල් ඉසින යන්ත්‍රය | 1370.00 |
| RC -1107 | 24,960.00 |
| RC-8183 | 24,960.00 |
| RD-8240 | 21,820.00 |
| RE-2600 | 23,400.00 |
| UQ-1933 | 4,110.00 |
| YG-0758 | 2,055.00 |
| ZA-9835 | 31,200.00 |
| 226-7521 | 18,720.00 |
| 56-1906 | 14,872.00 |
| ගල් රෝල | 12,480.00 |
| ග්‍රාස් කටර් | 2,740.00 |
| JD-4684 | 1,918.00 |
| II-2110 | 17,186.00 |
| ND-5124 | 31,616.00 |
| PF-4006 | 27,852.00 |
| QL-2901 | 3,288.00 |
| VI -1833 | 1,096.00 |
| වතුර මෝටරය | 1,145.00 |
| ZA -5039 | 85773.76 |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

***11. පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්***

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා</u>**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා, හිටපු සභාපතිවරුන්ගේ ඡායාරූප සභාවේ ප්‍රදර්ශනය කර ඇති නමුත් එය කිසිවෙකුටත් නොපෙනෙන බැවින් එය සුදුසු පරිදි ස්ථාන ගත කරන ලෙස ද සභාවේ නිළධාරීන්ට හා මන්ත්‍රීවරුන් සඳහා බයිසිකල් නැවැත්වීම සඳහා ආවරණයක් සහිත ස්ථානයක් සකස් කර දෙන ලෙස ද පවසන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ක්‍රීඩා පිටිය ගඟ පැත්තෙන් මීටරයක් පමණ ඇතුළට ගත හැකි නම් අංග සම්පූර්ණ පාපන්දු පිටියක් සකස් කළ හැකි බව ද ක්‍රීඩා කිරීමේදී බෝල ගඟට යන බැවින් දැල් ආවරණයක් සකස් කර දෙන ලෙස ද පැවසූ අතර අමීර් මරික්කාර් මහතාගේ නිවසට අනතුරුදායක ලෙස පැවති කොස් ගස කපා ඉවත් කිරීම පිළිබඳ ස්තුතිය පළ කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය</u>**

ගරු මන්ත්‍රීවරුන් සඳහා රු.5,000.00 ක දුරකථන දීමනාවක් ලබා දීම පිළිබඳ ගරු ආණ්ඩුකාරතුමාට ස්තුතිය පළ කරන අතර රෝහලේ සුනඛ ගැටලුව පවතින බව ද රෝහල සඳහා කසල බඳුන් 10 ක් අවශ්‍යව ඇති බව දන්වා ඇති නිසා එය ලබා දිය හැකි ද යන්නත් කොම්පෝස්ට් පොහොර අවශ්‍යව ඇති බැවින් එය ලබාදිය හැකිද යන්නත් විමසන ලදී. තුඹගොඩ හා තවත් අතුරු පාරවල් කිහිපයක වීථි පහන්වල ප්‍රශ්නයක් පැණ නැඟී ඇති බැවින් විදුලි බල මණ්ඩලය සමඟ එක් වී එය නිරවුල් කළ හැකිද යන්නත් තුඹගොඩ පන්සලේ කාණු පද්ධතිය සකස් කිරීම සඳහා සියලුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කරන බවත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා</u>**

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් අවුරුදු 26 ක් පුරා බළන්ගොඩට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙන් නොමැතිව සිටි බැවින් බළන්ගොඩ නගරයට ලැබිය යුතු වරප්‍රසාද බොහොමයක් අහිමි වූ බවද අවස්ථාවාදී කුහක දේශපාලනය තුළින් රත්නපුර දිස්ත්‍රික්කයේ තුන්වන බලවේගය වන බළන්ගොඩ තුළින් පිටස්තර මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට තේරීපත්වන බවද ඔවුන්ගෙන් බළන්ගොඩට කුඩම්මාගේ සැළකිළි ලැබුණු බවද පවසන ලදී. එමෙන්ම මෙවර මහ මැතිවරණය සඳහා බළන්ගොඩ නගර සභාවේ ගරු

මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා පොදුජන එක්සත් පෙරමුණ හරහා තරඟ කරන බැවින් ගරු මන්ත්‍රීවරුන් 16 දෙනා ඒ පිළිබඳව ආඩම්බර විය යුතු බව ද එතුමාගේ පියා බළන්ගොඩ සංවර්ධනයේ නියමුවා ලෙස කටයුතු කළ පුද්ගලයෙක් බව ද පවසන ලදී. එමෙන්ම තම අරමුණ හා බලාපොරොත්තුව වනුයේ පක්ෂ, ආගම්, කුළ භේදයකින් තොරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලබා ගැනීමට බළන්ගොඩ ජනතාවට තිබෙන අවසන් අවස්ථාව වන මෙම අවස්ථාවේදී බළන්ගොඩ ජනතාව, දූ පුතුන් හා බළන්ගොඩ සංවර්ධනය වෙනුවෙන් අකිල එල්ලාවල මැතිතුමා ජයග්‍රහණය කරවීම උදෙසා කටයුතු කළ යුතු බවද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා, අකිල එල්ලාවල මැතිතුමා යනු බළන්ගොඩ ජනතාව හඳුනන බළන්ගොඩ සංවර්ධනය හඳුනන බළන්ගොඩ පුද්ගලයෙක් බැවින් එතුමා පාර්ලිමේන්තු ගියහොත් එතුමාට ලැබෙන සියලු වරප්‍රසාද බළන්ගොඩ ජනතාවට ලැබෙන වරප්‍රසාද වන බවද මේ පිළිබඳව හොඳින් හිතා බලා බළන්ගොඩ ජනතාව වෙනුවෙන් සියලු දෙනා කැප වී වැඩ කටයුතු කරන ලෙස සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බව ද පවසන ලදී. එතුමාට ජයෙන් ජය වේවායි පතමින් තමන්ට හැකි උපරිම අයුරින් උදව් උපකාර කරන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා</u>**

ගරු උප සභාපතිතුමා පැවසූ ආකාරයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණත් එක්වී යන ගමනට බළන්ගොඩ පොදුජන පෙරමුණ ආසන සංවිධායක අකිල එල්ලාවල මැතිතුමාට බළන්ගොඩ ආසනයෙන් මෙවර අපේක්ෂකත්වය ලැබෙන බවද බළන්ගොඩට පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයක් ලබා ගැනීමට එතුමා සමග තමන් සූදානම් බවද ලබා දිය හැකි උපරිම සහයෝගය ලබා දෙන බවද පවසන ලදී.

එමෙන්ම තමන් ඇතුලු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන් තිදෙනා එක් වී බළන්ගොඩ නගර සභාවේ බලය එක්සත් ජාතික පක්ෂයට ලබා දුන් නමුත් ලබන ජනවාරි මස මෙම සභාව එක්සත් ජාතික පක්ෂයෙන් ලබා ගන්නා බවද මෙම වසර අවසාන වන තෙක් ගරු සභාපතිතුමා සමඟ සහයෝගයෙන් එක්ව වැඩ කටයුතු කරන බව ද පවසන ලදී.

එමෙන්ම වැසිකිළි ආධාර ලබා දීම තවමත් සිදු නොවූ බව ද නගර සභා පෙර පාසලේ සේවය කරන ශ්‍යාමා සිරිනි ශාන්ති මහත්මිය මාස දෙකක පමණ කාලයක් දීමනාවක් නොලබා සේවය කරන අතර එතුමියට දීමනාව ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද ඇල්ලෙපොල සරස්වතී සුසාන භූමිය සඳහා සුසාන භූමි නඩත්තුකරුවෙකු යොදවන ලෙෂ ද පවසන ලදී.

ගරු සභාපතිතුමාගේ වසර දෙකක කාලය අවසන් වූ පසු අවශ්‍ය නම් අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන ලෙසත් තම කණ්ඩායම එයට සහයෝගය ලබා දෙන බවත් පවසන ලදී. ඉරිදා පොළේ හා බස්නැවතුම්පළ වැසිකිළි වලවල් නව ආකාරයට සකස් කරන ලෙස ද, මොහාන් සාලිය එල්ලාවල මාවත දෙපසෙහි ඩිජිටල් පුවරු සවිකරන ලෙස ද පිට පළාත් වලින් පැමිණෙන පුද්ගලයින් සඳහා මුදල් අය නොකර වැසිකිළි පහසුකම් සකස් කර දීම, කරවිකැටිය මර්ගයේ පටු තැන් සඳහා කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම, නගර සභා සීමාව තුළ ඇති සියලුම කාණු සඳහා ස්ලැබ් යෙදීම, පිට පළාත් වලින් පැමිණෙන අයට හඳුනා ගැනීම සඳහා සෑම

නිවසකම වරිපනම් අංකය යෙදීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කිරීම, බළන්ගොඩ නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව වැඩි දියුණු කිරීම යන යෝජනා තමන් මෙවර අයවැය සඳහා යෝජනා කර ඇති අතර එම කාර්යයන් සිදු කරන ලෙසත් අලුතින් පැමිණි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතා කැඳවා පුහුණුවක් පැවැත්වීම සුදුසු බවත් පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා මෙවර මහ මැතිවරණය පොලිතීන් වලින් තොරව සිදු කිරීමටත් තම පක්ෂයේ සහයෝගයෙන් ජනාධිපති කරගත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආරක්ෂා කර ගතයුතු අතර පොදුජන පෙරමුණේ ඇතැමුන් නිදහස් පක්ෂයේ අයට ඡන්දය ලබා නොදෙන ලෙස ප්‍රකාශ කර ඇති බැවින් ඒ සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන ලදී. එනමුත් ජනාධිපතිතුමාට 2/3 බලය ලබා ගැනීම සඳහා තම පක්ෂයේ සහයෝගය ලබා දෙන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් අද දින ගරු සභාපතිතුමා නිවේදනයක් නිකුත් කරමින් නිළධාරීන් සමඟ සහයෝගයෙන් වැඩ කටයුතු සිදු කරන ලෙස පැවසූ අතර ඒ පිළිබඳ සතුටු වන බවත් අද දින වන විට ගරු සභාපතිතුමාගේ ක්‍රියාකලාපය සාධනීය මට්ටමකට පැමිණ ඇති අතර ගරු සභාපතිතුමා නම්‍යශීලී බවක් ද පෙන්නුම් කරන බව පවසන ලදී. එමෙන්ම මෙවර මැතිවරණ නීති කඩ කරන්නන් සඳහා ගරු සභාපතිතුමා සතු බලතල භාවිතා කරන ලෙස ද තාප්පවල පෝස්ටර් ගැසීමට ඉඩ නොදෙන ලෙස ද පවසන ලදී. එමෙන්ම එළඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී බළන්ගොඩ පොදුජන පෙරමුණ ආසන සංවිධායක තම ආදරණීය නායක අකිල එල්ලාවල මැතිතුමාට දියවන්නාව තරණය කිරීමට සියලු දෙනාගේ ශක්තිය ධෛර්යය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

බස්නැවතුම්පල සිට ක්‍රීඩා පිටිය ඉදිකර ඇත මාර්ග ගැට්ට නිසා වාහන ගමනාගමනයට බාධා ඇති වන බැවින් එම ස්ථානයේ වාහන තදබදයක් පවතින බව ද එම නිසා එම ගැට්ට කඩා ඉවත් කරන ලෙස ද අවුරුදු දිනවල පුද්ගලික බස්රථ ගාල් කරතැබීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සතු ඉඩම් යොදා ගන්නා ලෙස ද මගීන් පුරවා ගත් බස් රථ ඔරලෝසු කණුව අසලින් හරවා සම්පත් පියස අසලින් මගීන් බසවා යන බැවින් එය නතර කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසද අවුරුදු සමයේ කඩ හිමියන්ගේ රථ වාහන නතර කර තැබීම සඳහා ක්‍රීඩා පිටිය අසල පහසුකම් සලසා දීම හා එම වාහන සඳහා ආරක්ෂාව සලසා දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම සේනක පෙදෙසේ මාර්ගය තුල ඇති ටෙලිෆෝන් කණු ඉවත් කර දෙන ලෙසත් පෝය දිනවලදී ඇතැම් කඩ කාමර වසා නොතබන බැවින් එසේ නොකරන ලෙස කඩ හිමියන් දැනුවත් කරන ලෙසත් ටෙලිෆෝන් කණු වල කසල බඳුන් සවිකිරීම සුදුසු බවත් එසේ සවිකිරීම සඳහා අනුග්‍රාහකයෙකු සපයා දීම කළ හැකි බවත් පවසන ලදී.

එමෙන්ම බළන්ගොඩ මූලික රෝහල අසළ ඇති පෙට්ටි කඩ ඉවත් කරන ලෙස ද නගරයට අවලස්සන ලෙස පවතින ලොතරැයි කුටි 2X2 කුටි ලෙස විධිමත්ව සකස් කරන ලෙස ද ලංකා බැංකු මාවතෙහි නවතා ඇති බස්රථ ඉවත් කිරීම සඳහා අදාල අය දැනුවත් කරන ලෙස ද තුරු උයන පෙදෙස සංවර්ධනය කරන ලෙස ද හිෂාම් පු පැලස් අසළ කාණුවේ පතුල කොන්ක්‍රීට් කරන ලෙස ද බුහාරි හෝටලය අසළ ඇති අවිධිමත් භාවය විධිමත් කරන ලෙස ද උසාවිය සඳහා යන මාර්ගය නැවත විවෘත කිරීම සඳහා ගරු අධිකරණය දැනුවත් කරන ලෙස ද පවසන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මෙදින සභාවේ ගරු සභාපතිතුමාගේ නිවේදනවලදී සභාවේ කටයුතු වලට සහය දෙන බවට තමා ඇතුලුව ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුගේ නම් හැර ඉතිරි නම් පැවසීම සම්බන්ධව තම කණගාටුව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම තමන් කිසි දිනක ලබාගත් දීමනා තම පුද්ගලික ප්‍රයෝජනයට ගෙන නොමැති බව කිරිදිගල ජනතාව දන්නා බව ද මන්ත්‍රීවරුන් යෝජනාවක් ගෙන ආ විට නිළධාරින් එය කළ යුතු අතර තමන්ට එය පසු විපරම් කළ හැකි බව ද පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය</u>**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය හුණුකුඹුර සුදර්ශනගම මාර්ගයේ නඩත්තු කටයුතු අවසන් කිරීම පිළිබඳ ස්තුතිවන්ත වන අතර හුණුකුඹුර බුදු මැදුරට විදුලිය ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් රොෂාන් මහතාගේ නිවස අසළ මාර්ගයේ ඇති පස් ටික ඉවත් කර මාර්ගය සකස් කර දෙන ලෙසත් හුණු කුඹුර නාම පුවරුව අසළ බෝක්කුව කැඩී ඇති බැවින් එය සකස් කර දෙන ලෙසත් පැවසීය. එමෙන්ම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ බළන්ගොඩ ආසන සංවිධායක අකිල එල්ලාවල මැතිතුමා මෙවර මහ මැතිවරණයට ඉදිරිපත් වීම පිළිබඳ හා බළන්ගොඩ ආසනයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නැතිවීමේ අඩුපාඩුව පෙන්වා සභාවට අකිල එල්ලාවල මැතිතුමා ගැන පැහැදීමක් ඇති කිරීම පිළිබඳ ගරු උප සභාපතිතුමාට හා හිටපු සභාපතිතුමාට ස්තුතිය පළ කරන බවත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා</u>**

ඩිජිටල් නාම පුවරු සවි කිරීමේදී හිටපු සෑම මහජන නියෝජිතයෙකු සඳහාම සාධාරණයක් වන පරිදි අනෙකුත් මාර්ග වලත් එම ආකාරයෙන්ම නාම පුවරු සවි කරන ලෙස පවසන ලදී. එමෙන්ම ඉදිරියේදී පැමිණෙන මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ ජයග්‍රහණය කරන අතර රත්නපුර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පස්දෙනෙක් සිත්නක්කරම එම තනතුරු ලියාගෙන මෙන් සිටින බැවින් නවක බලපත්‍රලාභි මන්ත්‍රී තනතුරු දෙකක් පමණක් ඇති බව ද පැවසූ ගරු මන්ත්‍රීතුමා එම ස්ථානයක් සඳහා ගරු අකිල එල්ලාවල මැතිතුමාට යාමට හැකි බව ද පවසන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද නොමැතිවූවා නම් ගරු ජනාධිපති ගොඨාභය රාජපක්ෂ මැතිතුමාට එම ජයග්‍රහණය ලබා ගැනීමට නොහැකි බව තමන් ස්ථිරවම පිළිගන්නා බව ද දේශපාලන කුහකකම් නැවැත්විය නොහැකි බව ද පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා ඉතිහාසයේ බළන්ගොඩින් පාර්ලිමේන්තුවට ගිය තිදෙනෙක් සිටින අතර ක්ලිෆඩ් රත්වත්ත මැතිතුමා මල්ලිකා රත්වත්ත මැතිතුමිය හා ඒ.එල්.එම්.අබුසාලි මැතිතුමා යන තිදෙනාම බළන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරයෙක්ව හා සභාපති වශයෙන් සිට අනතුරුව පාර්ලිමේන්තුවට ගිය බවද  අකිල එල්ලාවල මැතිතුමාට තිබූ බාධක සියල්ල ඉවත්ව ඇති බව ද ලබන සභා වාරයේදී කථා අඩුවෙන් වැඩ වැඩියෙන් කරන සභාවක් බවට පත් කිරීමට කටයුතු කිරීම සුදුසු බව ද පවසන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර මහතාගේ පුතා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණෙන් මෙවර මහ මැතිවරණයට ඉදිරිපත් වන අතර ජනතා විමුක්ති පෙරමුණ යනු පරම්පරාවෙන් පරම්පරාවට යන පක්ෂයක් නොවන බවත්, රෝහණ විජේවීර මහතාගේ පුතාට අවශ්‍ය අවස්ථාවලදී පක්ෂයෙන් උදව් උපකාර කළ බවත්, පැවසූ අතර පක්ෂයේ සංස්කෘතියක් ප්‍රතිපත්තියක් පවතින බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12.අවසානය**

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා ගරු සභිකයින් සියලුදෙනාම අනවශ්‍ය දේවල් සඳහා කාලය වැය නොකරමින් සභාවේ කාලය කළමනාකරණය කර ගැනීමට කටයුතු කරන ලෙස ද සභාවේ කාර්යක්ෂමතාවය වැඩි කර ගන්නා ලෙස ද පවසන ලදී. එමෙන්ම පළාත් පාලන ආයතනයක කමිටු පිහිටුවීමේ මූලික අරමුණ වන්නේ සාකච්ඡා කළ යුතු කරුණු කමිටුවේදී සාකච්ඡා කර අදාළ තීරණය පමණක් සභාවේදී ලබා ගෙන සභාවේ කාලය කළමණාකරණය කර ගැනීම බව පවසන ලදී.

එමෙන්ම වැඩ කිරීමට අවශ්‍යනම් තනතුරු තානාන්නතර අවශ්‍ය නොවන අතර ඕනෑම අයෙකුට වැඩ කළ හැකි බවද නීත්‍යානුකූලව අදාළ කාලවලදී අදාළ අයට තනතුරු ලැබෙන බවද මැතිවරණයේදී සියලු දෙනාට එක සේ සාධාරණයක් කරන බවද පැවසූ ගරු සභාපතිතුමා දේශපාලනික වශයෙන් කුමන මතිමතාන්තර පැවතියද කුමන පක්ෂයකින් හෝ බළන්ගොඩ ආසනයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සිටිය යුතු බවද බළන්ගොඩ ඉපදුණ බළන්ගොඩ පුද්ගලයෙකුගේ නායකත්වය බළන්ගොඩට අවශ්‍ය බවද හදිසි අවශ්‍යතාවයකදී කෙනකෙනාගේ ලේකම්වරු පස්සේ යාමට නොහැකි අතර කෙන කෙනාගේ අඩත්තේට්ටම් වලට ලක්විය නොහැකි බවද අකිල එල්ලාවල මැතිතුමාට හා පේමදාස මැතිතුමාට පාර්ලිමේන්තු මහ මැතිවරණය තුළින් ජයග්‍රහණය අත්වේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.